# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## 2019 ජුනි මස 14 වන දින

## II වන කොටස

## අතිරේකය

(2019.06.17 දින නිකුත් කරන ලදී)


# අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන)

**1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගේ නියමය පරිදි පළකරන ලදී


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක.

මිල : රු. 12.00 තැපැල් ගාස්තුව : රු. 15.00

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

***2 වන වගන්තිය :*** මේ වගන්තිය මඟින් 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතට 144අ වගන්තිය ඇතුළත් කිරීම මඟින් ඒ පනත සංශෝධනය කරනු ලබන අතර, සංශෝධනයේ නීතිය බලපෑම වනුයේ ඒ වගන්තියේ නිශ්චිතව දක්වා ඇති අවස්ථානුගත කරුණු යටතේ යම් සැකකරුවකුට හෝ චූදිතයකුට අධිකරණයේ පෞද්ගලිකව ම පෙනී සිටින ලෙස නියම කිරීම අත්හැරීම සඳහා මහෙස්ත්‍රාත්වරයාට බලය ලබා දීමට විධිවිධාන සැලැස්වීම වේ.

# අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන)

එල්.ඩී.—ඕ. 5/2018

## 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

**1.** මේ පනත 2019 අංක දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. *ලුහුඬු නාමය.*

**2.** 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 144 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය එම පනතේ 144අ වන වගන්තිය ලෙස බලාත්මක විය යුතු යː- *1979 අංක 15 දරන පනතට 144අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.*

"විශේෂ අවස්ථානුගත කරුණු යටතේ සැකකරුට හෝ චූදිතයාට පෞද්ගලිකව ම පෙනී සිටින ලෙස නියම කිරීම අත්හැරිය හැකි බව.

144අ. (1) මහෙස්ත්‍රාත්වරයා ඉදිරියේ අපරාධ නඩුවක් පවරනු ලැබ ඇත්තේ කවර සැකකරුවකු හෝ චූදිතයකු සම්බන්ධයෙන් ද, එම සැකකරු හෝ චූදිතයා රඳවා තබා ගැනීමේ කාලසීමාව අවසානයේ දී හෝ නඩුව විභාග කරන එක් එක් දිනයේ දී, රඳවා තබා ගැනීමේ කාලසීමාව දීර්ඝ කිරීම සඳහා හෝ වෙනත් යම් කාර්යයක් සඳහා එම සැකකරුට හෝ චූදිතයාට අධිකරණයේ පෞද්ගලිකව ම පෙනී සිටින ලෙස නියම කිරීම මහෙස්ත්‍රාත්වරයා විසින් ස්වකීය අභිමතය පරිදි අත්හරිනු ලැබිය හැකි ය.

(2) (4) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති හේතු එකක් හෝ වැඩි ප්‍රමාණයක් මත, යම් සැකකරුවකු හෝ චූදිතයකු අධිකරණයේ පෞද්ගලිකව ම පෙනී සිටීමට නියම කිරීම අත්හරිනු ලැබිය හැකි බවට මහෙස්ත්‍රාත්වරයා සෑහීමකට පත්වන්නේ නම්, (3) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති අදාළ තැනැත්තා විසින් සිදු කරනු ලබන ඉල්ලීමක් මත, එම සැකකරුට හෝ චූදිතයාට පෞද්ගලිකව ම පෙනී සිටීමට නියම කිරීම එසේ අත්හරිනු ලැබිය හැකි ය.

(3) සැකකරුවකු හෝ චූදිතයකු සම්බන්ධයෙන්, (2) වන උපවගන්තිය යටතේ ඉල්ලීමක්-

(අ) නීතිපතිවරයා විසින්; හෝ

(ආ) අවස්ථාවෝචිත පරිදි, සැකකරු හෝ චූදිතයා විසින් ම හෝ ඔහුගේ නීතිඥවරයා විසින්; හෝ

(ඇ) අදාළ පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිවරයා විසින්; හෝ

(ඈ) සැකකරු හෝ චූදිතයා රඳවා ඇති බන්ධනාගාරයේ බන්ධනාගාර අධිකාරිවරයා විසින්,

කරනු ලැබිය යුතු ය.

(4) මහෙස්ත්‍රාත්වරයා විසින් (1) වන උපවගන්තිය යටතේ සැකකරුට හෝ චූදිතයාට පෞද්ගලිකව ම පෙනී සිටින ලෙස නියම කිරීම අත්හැරීම, පහත දැක්වෙන හේතු මත සිදුකරනු ලැබිය හැකි යː-

(අ) සැකකරුගේ හෝ චූදිතයාගේ ජීවිතයට තර්ජනයක් හෝ බරපතළ හානියක් පිළිබඳ සැකයක් පවතින අවස්ථාවක දී;

(ආ) සැකකරු හෝ චූදිතයා විසින් සිදුකරන ලදැයි කියනු ලබන වරදට මහජනතාව දක්වන ප්‍රතික්‍රියාව මඟින් සාමය කඩවීමක් සිදු වීමට ඉඩ ඇති අවස්ථාවක දී;

(ඇ) රඳවා තබා ඇති සැකකරු හෝ චූදිතයා ඉන් මිදී පලා යාමට හෝ ස්වෙච්ඡාවෙන් නොවන ආකාරයට ඉන් ඉවත් කරනු ලැබීමට ඉඩ ඇති අවස්ථාවක දී; හෝ

(ඈ) සැකකරු හෝ චූදිතයා අධිකරණයේ නඩු කටයුතුවලට බාධා කිරීමට ඉඩ ඇති අවස්ථාවක දී.

(5) මහෙස්ත්‍රාත්වරයා විසින්, (1) වන උපවගන්තිය යටතේ සැකකරුවකුට හෝ චූදිතයකුට අධිකරණයේ පෞද්ගලිකව ම පෙනී සිටීමට නියම කිරීම අත්හරින අවස්ථාවක දී, ඒ සඳහා වන හේතු ලිඛිතව වාර්තා කරනු ලැබිය යුතු අතර, එම සැකකරුට හෝ චූදිතයාට-

(අ) නීතිඥවරයකු මගින් අධිකරණයේ දී තමා නියෝජනය කරනු ලැබීමට; සහ

(ආ) සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධක පහසුකම් පවතින අවස්ථාවක දී, ඔහුගේ නියෝජනය එවැනි සම්බන්ධකයක් හරහා සිදු කිරීමට,

අවසර දෙනු ලැබිය යුතු ය.

(6) එවැනි සැකකරුවකු හෝ චූදිතයකු රඳවා තබා ඇති ස්ථානය, එම සැකකරුට හෝ චූදිතයාට අධිකරණයේ පෞද්ගලිකව පෙනී සිටීමට නියම කිරීම අත්හරින ලද මහෙස්ත්‍රාත්වරයාගේ අධිකරණ කොට්ඨාසය තුළ පිහිටන්නා වූ අවස්ථාවක දී, නඩුව කැඳවීමෙන් පසු පැය හතළිස් අටකට නොවැඩි කාලයක් තුළ එම මහෙස්ත්‍රාත්වරයා විසින් එම රඳවා තබා ඇති ස්ථානය බැලීමට යා යුතු අතර, එසේ රඳවා තබන සැකකරුගේ හෝ චූදිතයාගේ යහසාධනය පිළිබඳ සොයා බැලිය යුතු ය.

(7) සැකකරු හෝ චූදිතයා රඳවා තබා ඇති ස්ථානය, එම සැකකරුට හෝ චූදිතයාට අධිකරණයේ පෞද්ගලිකව ම පෙනී සිටීමට නියම කිරීම අත්හරින ලද මහෙස්ත්‍රාත්වරයාගේ අධිකරණ කොට්ඨාසයෙන් පිටත පිහිටන්නාවූ අවස්ථාවක දී, (6) වන උපවගන්තියේ සඳහන් කර ඇති කාර්යය සඳහා සැකකරු හෝ චූදිතයා රඳවා තබා ඇති ස්ථානය බැලීමට යන ලෙස අදාළ අධිකරණ කොට්ඨාසය විෂයයෙහි අධිකරණ බලය ඇති මහෙස්ත්‍රාත්වරයාට නියමිත ආකෘති පත්‍රය මඟින් වහාම දැනුම් දී ඉල්ලා සිටීම, එම මහෙස්ත්‍රාත්වරයාගේ කාර්යය විය යුතු ය.

(8) සැකකරු හෝ චූදිතයා රඳවා තබා ඇති ස්ථානය පිහිටා ඇත්තේ කවර මහෙස්ත්‍රාත්වරයකුට අයත් අධිකරණ කොට්ඨාසය තුළ ද, එම මහෙස්ත්‍රාත්වරයාට රඳවා තබා ඇති ස්ථානය බැලීම සඳහා යාමට හැකියාවක් නොමැති අවස්ථාවක දී, (6) වන උපවගන්තියේ සඳහන් කාර්යය සඳහා සැකකරු හෝ චූදිතයා රඳවා තබා ඇති ස්ථානය බැලීමට යන ලෙස නියමිත ආකෘති පත්‍රය මඟින් වෙනත් මහෙස්ත්‍රාත්වරයකුට වහාම දැනුම් දී ඉල්ලා සිටීම එම මහෙස්ත්‍රාත්වරයාගේ කාර්යය වන්නේ ය.

(9) (7) වන උපවගන්තිය හෝ (8) වන උපවගන්තිය යටතේ දැනුම් දීමක් කරනු ලැබුවේ යම් මහෙස්ත්‍රාත්වරයකුට ද, ඒ මහෙස්ත්‍රාත්වරයා විසින් එම සැකකරු හෝ චූදිතයා රඳවා තබා ඇති ස්ථානය බැලීමට යන ලෙස ඉල්ලා සිටින ආකෘති පත්‍රය ඔහුට ලැබීමෙන් පැය හතළිස් අටකට නොවැඩි කාලයක් තුළ එම ස්ථානය බැලීමට යා යුතු අතර ඒ පිළිබඳව සැකකරුට හෝ චූදිතයාට පෞද්ගලිකව ම පෙනී සිටීමට නියම කිරීම අත්හරින ලද මහෙස්ත්‍රාත්වරයා වෙත තත්කාර්යය සඳහා නියමිත ආකෘති පත්‍රයෙන් වාර්තා කරනු ලැබිය යුතු ය.

(10) එසේ රඳවා තබා සිටින එවැනි යම් සැකකරුවකු හෝ චූදිතයකු (6) වන, (7) වන හෝ (8) වන උපවගන්තිවල විධිවිධාන ප්‍රකාරව බන්ධනාගාරයට පැමිණෙන මහෙස්ත්‍රාත්වරයකු වෙත ඉදිරිපත් කිරීම සහ එම මහෙස්ත්‍රාත්වරයාට අවශ්‍ය පහසුකම් සැලැස්වීම බන්ධනාගාර අධිකාරීවරයාගේ කාර්යය විය යුතු ය.”.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**3.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.